**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි.**

# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## තනතුරු ඇබෑර්තු - 2025

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පහත සඳහන් අනධ්‍යයන තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2025.09.25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. විගණන සහකාර II ශ්‍රේණිය

- **සුදුසුකම් :**

**1.** අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

I. සිංහල භාෂාව/දෙමළ භාෂාව
II. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
III. ගණිතය

සහ

**2.** අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (අ.පො.ස. (උසස් පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම)

සහ

**3. තනතුරට විශේෂ වූ සුදුසුකම්**

(අ). ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ මූලික (Preliminary) අදියර / ආවාසරික (Licentiate ) I අදියර/ පදනම් (Foundation) අදියර / CAB I / විධායක අදියර (Executive) සමත් වීම හෝ ඊට සමාන වෙනත් සුදුසුකම් ලබා තිබීම

හෝ

(ආ). වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ පදනම් අදියර සමත් වීම (CIMA)

හෝ

(ඇ). ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනයේ (SLIATE) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත් වීම. (HNDA)

හෝ

(ඇ). ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සාමාජිකත්වය ලබා තිබීම

සහ

**4.** විගණන කටයුතු පිළිබඳ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 2 ක පලපුරුද්දක් ලබා තිබීම.

මාස හයකට නොඅඩු පරිගණක යෙදවුම් (Computer Applications) පිළිබඳ පිළිගත හැකි සුදුසුකම් පිළිගත් ආයතනයකින් ලබා ගත් අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

**සටහන :**

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ගිණුම්කරණය/ විගණන පිළිබඳ විශ්වවිද්‍යාල පද්ධතියේ/ රාජ්‍ය ආයතනවල / පිළිගත් පුද්ගලික ආයතනවල ලද පළපුරුද්ද ඉහත අංක 4හි සඳහන් විගණනය පිළිබඳ පළපුරුද්ද සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

- **තේරීම** : සම්මුඛ පරීක්ෂණයකින්.
- **වැටුප් ක්‍රමය**: U-MN 2(II)
- **වැටුප් පරිමාණය** : රු 61,275-18x890-77,295 (මාසික)
  (මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2022

## 02. විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)

- **සුදුසුකම් :**

1. (අ) ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ ස්ථිර කර තිබීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත් වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාළ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ආ) ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ ස්ථිර කර තිබීම හා අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කාර්මික කුසලතා සහිත සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ ස්ථිර කර තිබීම හා අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) කාර්මික කුසලතා සහිත සේවා පළපුරුද්දක් තිබීම.

**වෙනත්:**

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. මනා චරිතවත් පුද්ගලයෙකු විය යුතුය.

- වැටුප් ක්‍රමය: U-PL 2(III)
- **වැටුප් පරිමාණය** : රු. 44,575 – 16×490 – 52,415 (මාසික)
  (මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)
- **තේරීම** : වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.
- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2024

අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ යුතු අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතික වල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර අංශ ප්‍රධාන මඟින් මා වෙත 2025.09.25 දින හෝ එදිනට පෙර එවිය යුතුය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ලේඛකාධිකාරී-වැඩ බලන)**
**2025.09.09**